# නාග විශ්වාසය පිළිබඳ මානවවංශ හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

කේ.එස්.එන්.කේ. කරුණාදාස, කේ.එම්.එස්.ආර්. කුලතුංග[47]

මෙම පර්යේෂණය සඳහා අප මූලික ලෙස තේමාව කර ගෙන ඇත්තේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව වැළිමුවපොතාන ග්‍රාමනිලධාරී වසමේ පිහිටා ඇති වැළිමුවපොතාන ශ්‍රී නාගතම්බිරාන දේවාලය වේ. මෙම ස්ථානයට ළඟාවීම සඳහා කැබිතිගොල්ලෑව ප්‍රධාන නගරයේ සිට හොරොව්පොතාන මාර්ගයේ කි.මී 23ක් පමණ ගමන් කළ පසු වැළිමුවපොතාන ග්‍රාමය හමුවේ. එම ග්‍රාමයේ ප්‍රධාන වැවේ වැව් බැම්ම දිගේ මීටර් 500ක් පමණ දුරක් ගොස් හමුවන පළමු අතුරු මාර්ගයෙන් දකුණට මීටර් 100ක් පමණ දුරක් ගමන් කළ විට මෙම ස්ථානයට ළඟා විය හැකි ය. මෙම ස්ථානයේ ආංශුක පිහිටීම ගත්කළ ප්‍රධාන ලෙස ම මෙය ජල මූලාශ්‍රයක් කේන්ද්‍ර කර ගෙන පවතී. දේවාලයට උතුරින් වැළිමුවපොතාන ප්‍රදේශයේ වැව පිහිටා ඇති අතර එහි ප්‍රධාන ඇළ මාර්ගය මෙම දේවාලය අසලින් ගලා බසී. දේවාලයට නැගෙනහිරින් රක්ෂිත වනය ද බටහිරින් කුඹුරු යාය ද පිහිටා ඇත. බෑවුම් සහිත භූමියක පිහිටා තිබුණ ද මෙහි භූමිය මඳක් උස් ව පවතී. මෙහි ඊට ආසන්නව නැගෙනහිරින් විශාල තුඹසක් ද ඒ ආසන්න ව දේවාලයට ගිනිකොණ දෙසට වන්නට ස්වාභාවික ව පිහිටි ශිලා කොටසක් පවතී. මෙම දේවාලය පරම්පරා පහක සිට පමණ පැවත එන බව ප්‍රධාන කපු මහතා සඳහන් කරයි. මෙම පර්යේෂණයේ මූලික අරමුණු වන්නේ මෙහි ඓතිහාසිකත්වය සොයා බැලීම, ඒ සම්බන්ධ ව ඇති පුරාවෘත්ත සාධක විමසීම, නාග විශ්වාසය පිළිබඳ ව ප්‍රදේශයේ ජනතාවගේ මානවවංශ දත්ත ලබා ගැනීම, එම තොරතුරු මඟින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සමඟ ගලපමින් නාග විශ්වාසයට දීර්ඝ ඉතිහාසයක් පැවතෙන බව තහවුරු කිරීම අවසාන අරමුණ වේ. මෙම පර්යේෂණයේ අධ්‍යයන සීමා කිහිපයකි. ඒ අතරින් ප්‍රධාන ලෙස මේ පිළිබඳ ඇති තොරතුරු පුරාවෘත්ත සාධක වීම, භෞතිකත්වය ඉක්මවා ගිය අධිභෞතිකවාදී අදහසක් වීම යනුවෙනි. මෙය මඟින් කතරගම මහා දේවාලය, යාපනය මහා දේවාලය මෙන් ම මහනුවර ශ්‍රී දළදා මාළිගාව, ශ්‍රී මහා බෝධිය යන පූජනීය ස්ථාන වලට වාර්ෂික ව සහභාගි වන අතර මෙම ප්‍රදේශයේ සෑම වසරකම ඇසළ මහා පෙරහර පවත්වයි. නාගයෙක් දෂ්ඨ කිරීම නිසා රෝගී වූ ලෙඩුන්ට තුඹස් මැටියෙන් හා ඇල් ජලයෙන් පමණක් සුවපත් කිරීම සඳහා මෙම දේවාලය ප්‍රසිද්ධ ව සිටී. ඒ අනුව මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කරනු ලබන්නේ මූලික ලෙස නාග විශ්වාස පිළිබඳ ඇති මූලාශ්‍ර අධ්‍යයනය, ප්‍රදේශයේ ජනතාවගේ අදහස් එකතු කිරීම, දේවාලයේ සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳ විමසීම, නාග විශ්වාසය පිළිබඳ ව ශ්‍රී ලංකාවේ පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අධ්‍යයනය යනුවෙනි. ඒ තුළින් නාග විශ්වාසය අද බිහිවූවක් නොව එයට දීර්ඝ ඉතිහාසයක් පවතින බව සනාථ කිරීම මෙහි මූලික අරමුණ වී තිබේ. නාග විශ්වාසයට දීර්ඝ ඉතිහාසයක් පවතින බවත් නූතනයේ පවා එයට හිමිවන ස්ථානය සුවිශේෂී වන බවත් සනාථ කරමින් මානවවංශ හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් කිරීමට මේ තුළින් අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද: නාග විශ්වාසය, ශ්‍රී නාගතම්බිරාන දේවාලය, අධිභෞතිකවාදය, මානවවංශ දත්ත

[47] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.